# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2362/47 - 2023 දෙසැම්බර් මස 13 වැනි බදාදා - 2023.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 130972 දරන සහ අංක 10, රේමන්ඩ් පාර, නුගේගොඩ යන ලිපිනයෙහි පිහිටා ඇති, සමාගමක් වන "ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ, II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුමට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන තීරයේ දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් "ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය මෙම නියමය මගින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ද ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරයේ) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

   අ). ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම;

   යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට සම්බන්ධ උපාධි පාඨමාලාව අංක 10, රේමන්ඩ් පාර, නුගේගොඩ ශ්‍රී ලංකාව යන ස්ථානයේ පමණක් පැවැත්විය යුතුය.

3. ආයතනය විසින්, මෙම නියමය ප්‍රකාශයට පත්කළ දිනයේ සිට සෑම වසර පහකට (5) වරක් නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමිය යුතුය.

1A - PG 6569 — 286 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II වන උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධිය* | *II වැනි තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඒඩ් ගෞරව (ප්‍රාථමික අධ්‍යාපනය) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.